# කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය
## ශාස්ත්‍රවේදී ගෞරව උපාධි සිව්වන වසර පරීක්ෂණය
## පළමු සෙමෙස්තරය – 2022/2023
## SLG 4184 - සිංහල භාෂා අධ්‍යයනය ඓතිහාසික (I)
(පැ දෙකයි)

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

---

1. "භාෂා පරිණාම සාධක හා සාක්ෂ්‍ය භාෂාවක් පිළිබඳ ඓතිහාසික විග්‍රහයක දී වැදගත් වේ" යන ප්‍රකාශය සිංහල භාෂා පරිණාමය ඇසුරෙන් විග්‍රහ කරන්න.

   හෝ

   සිංහල භාෂාවේ ප්‍රභවය පිළිබඳ ආර්ය-ද්‍රාවිඩ වාදය සිංහල භාෂාධ්‍යයන ගුරුකුල අතර දීර්ඝ කාලීන මතභේදවලට තුඩු දුන් කරුණක් වූ ආකාරය ආර්ය-ද්‍රාවිඩ වාදයට පක්ෂ විපක්ෂ මත ඇසුරෙන් සාකච්ඡා කරන්න.

2. සිංහල භාෂාවේ පරිණාමය අධ්‍යයනය කිරීමේ දී ප්‍රමාණ කොට ගැනෙන කාලානුක්‍රමික යුග බෙදීම විල්හෙල්ම් ගයිගර්, විමල්. ජී. බලගල්ලේ සහ ඩබ්. එස්. කරුණාතිලකගේ අදහස් ඇසුරෙන් තුලනය කරන්න.

3. "සිංහල ප්‍රාකෘත ශබ්ද පද්ධතිය සමකාලීන ඉන්දීය ප්‍රාකෘත භාෂා ලක්ෂණවලට සමාන වූ අතර මේ ප්‍රකාශයේ පුරාතන ඉන්දු ආර්ය ශබ්ද පද්ධතියේ සංක්ෂිප්ත වීමකින් ද නිර්මාණය වූවකි" සත්‍යාසත්‍යතාව ප්‍රාකෘත යුගයට අයත් ශිලා ලේඛන සාක්ෂ්‍ය ප්‍රමාණ ව විමසන්න.

4. සිගිරි ගී, ශිලා ලේඛන සාක්ෂ්‍ය සහ ධම්පියා අටුවා ගැටපදය වැනි මූලාශ්‍රය සිංහල භාෂාවේ පුරාතන සහ මධ්‍ය යුගයේ භාෂාවේ සංලක්ෂණ අධ්‍යයනයට අවශ්‍ය පසුබිම සකසන ආකාරය සනිදර්ශනව තුලනය කරන්න.

5. "අභිශ්‍රැතිය හා ස්වර සමීකරණය සිංහල භාෂාවේ ඓතිහාසික ශබ්ද පරිණාමයේ විශද ලක්ෂණයකි." මෙම කියමන පිළිබඳ විල්හෙල්ම් ගයිගර්ගේ සහ සෙනරත් පරණවිතානගේ මත තුලනාත්මකව විග්‍රහ කරන්න.